*සැ.යු.:* 2025.09.19 දින පළ කරන ලද අංක 2455 *ගැසට්* පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,456 - 2025 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය … | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය … | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … | — |
| වෙනත් පත්කිරීම් ආදිය … … … … … … | 1020 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය … … … … … | — |
| රජයේ නිවේදන … … … … | 1021 |
| මිල පාලන දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් … … … … | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන … … … … | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා … … … … | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් … … … … | 1024 |
| නැවියන්ට දැන්වීම් … … … … | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් … … … … | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# වෙනත් පත්කිරීම් ආදිය

2025 අංක 601

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් පහත නම් සඳහන් වෛද්‍ය නිලධාරීන් 2024 ඔක්තෝබර් මස 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කපිතාන් නිලයට නිල උසස් කිරීම අනුමත කරමි :

1. ලුතිනන් පැලවත්ත ලියනගේ දොන් රවින්ද්‍ර ප්‍රභාත් ශ්‍රීලයුවෛබ (නි/72258);
2. ලුතිනන් කර්ණසූරි රාගලගේ චමරු ඉසුරුවර්ණ පෙරේරා ශ්‍රීලයුවෛබ (නි/72260);
3. ලුතිනන් අයේෂ් මදුශාන් විජේමාන්න ශ්‍රීලයුවෛබ (නි/72261);
4. ලුතිනන් සිංහබාහු මුදියන්සේලාගේ රාජික උවසර සිංහබාහු ශ්‍රීලයුවෛබ (නි/72265);
5. ලුතිනන් ගමගේ පසන් පූර්ණ මල්ෂාන් අල්විස් ශ්‍රීලයුවෛබ (නි/72266);
6. ලුතිනන් වීරසිංහ ආරච්චිලාගේ සහන් සචින්තක බණ්ඩාර ශ්‍රීලයුවෛබ (නි/72267);
7. ලුතිනන් කෝණාර මුදියන්සේලාගේ නදීශාන් තරිඳු චතුරංග ශ්‍රීලයුවෛබ (නි/72270);
8. ලුතිනන් ප්‍රමුදිත පැතුම් හේවාවිතාරණ ශ්‍රීලයුවෛබ (නි/72271);
9. ලුතිනන් පතයාල රාලලාගේ පසිඳු චාමර ශ්‍රීලයුවෛබ (නි/72273);
10. ලුතිනන් හේවාවසම් ගොඩැල්ලගේ ඉඳුමිණ භාග්‍යා ශ්‍රීලයුවෛබ (නි/72274);
11. ලුතිනන් හපුඅච්චි අප්පුහාමිලාගේ හිරන මධුමාදව සිරිකුමාර ශ්‍රීලයුවෛබ (නි/72275);
12. ලුතිනන් කුට්ටිකන්ද ගමඇති රාළලාගේ කසුන් තිළිණ ගණනාථ ප්‍රේමරත්න ශ්‍රීලයුවෛබ (නි/72276);
13. ලුතිනන් ඉහල ගමගේ කවින්ද යහම්පත් ශ්‍රීලයුවෛබ (නි/72278);
14. ලුතිනන් මාතලේ රාළලාගේ දිනිඳු ප්‍රසාද් බංඩාර ශ්‍රීලයුවෛබ (නි/72279);
15. ලුතිනන් ලියනගේ දුලංජන ප්‍රසාද් වීරසිංහ ශ්‍රීලයුවෛබ (නි/72280);
16. ලුතිනන් කළුතර ගුරුගේ තිසුර දක්සිත සඳරුවන් සිල්වා ශ්‍රීලයුවෛබ (නි/72281);
17. ලුතිනන් රණසිංහ ආරච්චිගේ දොන් අමිල මේධක ශ්‍රීලයුවෛබ (නි/72282);
18. ලුතිනන් මොහොමඩ් ඉක්බාල් මොහොමඩ් අෆ්ලාල් ශ්‍රීලයුවෛබ (නි/72285);
19. ලුතිනන් කළු ආරච්චිලාගේ ගයාන් සමන් කුමාර කළුආරච්චි ශ්‍රීලයුවෛබ (නි/72286);
20. ලුතිනන් ලියනගේ ලක්මාල් ඉඳුනිල් ශ්‍රීලයුවෛබ (නි/72287);
21. ලුතිනන් රවිදු දේශාන් රණවීර ශ්‍රීලයුවෛබ (නි/72288);
22. ලුතිනන් මීගහලන්ද දූරගේ යශ්මි නවෝදා ලමාවංස ශ්‍රීලයුවෛබ (නි/72290);
23. ලුතිනන් රශ්මි ව්‍යංගා පල්ලෙවෙල ශ්‍රීලයුවෛබ (නි/72291);
24. ලුතිනන් ධනපාල මුදියන්සේලාගේ වදිනි ශාක්‍යා ගුණවර්ධන ශ්‍රීලයුවෛබ (නි/72293);
25. ලුතිනන් ගාර්ඩිය හේවාවසම් තුඩුවගේ කසුනි මුදාරා හේවාවසම් ශ්‍රීලයුවෛබ (නි/72294).

බී කේ ජී එම් එල් රොද්‍රිගෝ,
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2025 අගෝස්තු මස 30 වැනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

09-272/1

---

2025 අංක 602

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් පහත නම සඳහන් වෛද්‍ය නිලධාරී 2024 ජූලි මස 05 වැනි දින බලපැවැත්වෙන පරිදි ලුතිනන් නිලයට නිල උසස් කිරීම අනුමත කරමි :

දෙවන ලුතිනන් මාරස්සන හේරත් මුදියන්සේලාගේ තිහාර උපමාද වීරසේකර ශ්‍රීලයුවෛබ (නි/72036).

බී කේ ජී එම් එල් රොද්‍රිගෝ,
ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2025 අගෝස්තු මස 30 වැනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

09-272/2

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/69/2025/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.09.26** වැනි දින සිට **2025.10.10** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2025.10.17 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, දෙහි කොට්ඨාසයේ 97 වෙළුමේ, 01, 02 පත්ඉරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාවේ, බලයලත් මානක එස්. එච්. ප්‍රනාන්දුගේ අංක 449 සහ 1955.06.03 දිනැති පිඹුරේ (ලියාපදිංචි කිරීමේ සැලැස්මේ අංක 1 දෙහිවල) පිහිටි ඉඩමේ කැබලි අංක 257 බී සඳහා මායිම්,<br>*උතුරට* : ලොට් 255;<br>*නැගෙනහිරට* : මල්වත්ත පාර;<br>*දකුණට* : ලොට් 258 හි 1. ලොට් 259 හා පාර;<br>*බස්නාහිරට* : ලොට් 257 ඒ.<br>*බිම් ප්‍රමාණය* : රූ.01, පර්. 10.54 | 01. චමරි ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.02.07 දින ලියා සහතික කරන ලද අංක 725 දරන විකුණුම් ඔප්පුව. |

09 - 267

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/70/2025/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.10.03** වැනි දින සිට **2025.10.17** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2025.10.24 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, දෙහි CON/SP/1/29 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල - ගල්කිස්ස ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, දෙහිවල පළාත් පාලන ඡන්ද කොට්ඨාසයේ, ඉනිටියම් පාර ග්‍රාමයේ "අලුත්වත්ත" නමැති ඉඩමේ පිහිටි සහාධිපත්‍ය දේපළ සඳහා බලයලත් මානක කේ. සෙල්වරත්නම් විසින් 2002.04.12 දින මැන සාදන ලද අංක 9730 දරන පිඹුරේ වරිපනම් අංක 24/2/6 සහ ඒකක අංක B6 සඳහා මායිම් :<br><br>*උතුරට* : CE 1, CE 13 විවෘත පෙදෙස් සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මධ්‍යය;<br><br>*නැගෙනහිරට* : යුනිට් B7, CE13, විවෘත පෙදෙස සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මධ්‍යය;<br><br>*දකුණට* : CE27, යුනිට් B5, CE7, විවෘත පෙදෙස සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මධ්‍යය; | 01. වී. බාලසුබ්‍රමනියම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2004.07.28 දින ලියා සහතික කරන ලද අංක 3067 දරන විකුණුම් ඔප්පුව. |

**උපලේඛනය (*සම්බන්ධිතයි*)**

| *ලියාපදිංචි පොත්වල කැඩිබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
| --- | --- | --- |
| | *බස්නාහිරට* : CE7, CE1, විවෘත පෙදෙස් සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මධ්‍යය.<br><br>*මුදුන* : යුනිට් C6 සහ මෙම ඒකකය වෙන්වන කොන්ක්‍රීට් බිමේ මධ්‍යය.<br><br>*පතුල* : A6 ඒකකය සහ මෙම ඒකකය වෙන්වන කොන්ක්‍රීට් බිමේ මධ්‍යය.<br><br>*බිම් ප්‍රමාණය* : ව.අ. 753. | |

09 - 268

---

**ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

**අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධිත පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1)26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුභාෂිණී දයානන්ද,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2025 සැප්තැම්බර් මස 19 වැනි දින.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01) 46776 | විජේසුන්දර මුදියන්සේලාගේ යසසි දිව්‍යානුත්තරා විජේසුන්දර, අංක 279/2, සුදර්ශන මාවත, මාලඹේ. | නිලන්ත විජේසිංහ මයා, ගනේමුල්ල, මිල්ල ගහවත්ත, අංක 405, ගලහිටියාව |
| (02) 46778 | මීමනගේ තරංග මධුසංක පෙරේරා මයා, අංක 86, ජඹුරලිය, මඩපාත. | වීරපෙරුම අච්චි අතුකෝරලාගේ දොන් චතුරංග දිල්හාන් මයා, අංක 1/2, තැඹිලිවත්ත, මාකන්දන, මඩපාත. |
| (03) KU 451 | මාලදෙනියගේ නවීන් කෞශල්‍යා නිස්සංක මයා, අංක 301/2A, පන්සල් හංදිය, බිංගිරිය. | මාරා බැද්දේ රත්නායක මුදියන්සේලෑ ගෙදර රන්බණ්ඩා මයා, සණස අසල, කුරුණෑගල පාර, බිංගිරිය. |
| (04) KU 381 | කන්දයියා අරුනායිස් මයා, අංක 55, තලගහමුලවත්ත, ඉහලවෙල, කෙස්ගල්ල. | දෙහිමඩුවේ ගෙදර අජිත් කුමාර ද සිල්වා මයා, අංක 623, විජය ශ්‍රීගම, රජවැල්ල. |
| (05) KU 479 | තුයියාදෙණියේ ගෙදර ධරමපාල මයා, අංක H/63/3/A, සොල්දර ගෙදර, අල්පත්ගම, මාකෙහෙල්වල. | කනන්ගේ ගෙදර සමන්ත ජනප්‍රිය නන්දන මයා, හිඟුල, බටවල. |
| (06) GAM 543 | දිසානායක මුදියන්සේලාගේ කාන්ති මල්ලිකා මිය, අංක 4/1, මැද්දේගොඩ, ගණේමුල්ල. | ගිණිමැල්ලගහ හේවගේ මනෝජ් කුමාර මයා, අංක 58/52 A, ලෙක්සයිඩ් වත්ත, වල්පොල, රාගම. |
| (07) 46663 | තලංගම අප්පුහාමිලාගේ උපාලි සරත්චන්ද්‍ර මයා, අංක 295/A, කෙලින් වීදිය, කොස්ගම. | ප්‍රැන්සිස්ගේ දොන් ටියුරින් පෙරේරා මයා, අංක 66/5, යටියන්තොට පාර, අවිස්සාවේල්ල. |

09-289

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කඹුරුපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116 ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංක : 2926582, 2944131 සහ 2942746
රත්න ප්‍රොඩ්‍යුසර්ස් සිනමන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් 2015 ඔක්තෝබර් මස 14 වැනි දින සහතික කරන ලද අංක 15502 දරන උකස් බැඳුම්කරය සහ අංක 15503 දරන අතිරේක උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති, වෙනත් කරුණු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන කුඹුරුපිටිය, අකුරැස්ස

පාරේ, ලියාපදිංචි කාර්යාල සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති රත්න ප්‍රොඩ්‍යුසර්ස් සිනමන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ/හෝ උකස්කරු හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී රත්න ප්‍රොඩ්‍යුසර්ස් සිනමන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පැහැර හැර ඇති හෙයින්,

සහ මෙහි පහත පෙන්වන පරිදි එකී උකස් බැඳුම්කරයන් මත, ප්‍රතිව්‍යුහගත පූර්ව නැව්ගත කිරීමේ කෙටිකාලීන ණය අංක 2926582 සහ 2944131 සම්බන්ධයෙන් දිය යුතු මුල් මුදල සහ පොළිය සහ ප්‍රතිව්‍යුහගත පූර්ව නැව්ගත කිරීමේ කෙටිකාලීන ණය අංක 2942746 සම්බන්ධයෙන් දිය යුතු මුල් මුදලේ කොටස වශයෙන්, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන අසූ තුනයි තුන් ලක්ෂ අනූ හතර දහස් අටසිය දහසයයි ශත හතළිස් දෙකක (රු. 83,394,816.42) මුදලක් 2025 ජුනි මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අසූ තුනයි තුන් ලක්ෂ අනූ හතර දහස් අටසිය දහසයයි ශත හතළිස් දෙකක (රු. 83,394,816.42) මුදල අය කර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී අංක 15502 සහ 15503 දරන උකස් බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ, කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ ඇරැව්වාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි -

(*a*) ප්‍රතිව්‍යුහගත පූර්ව නැව්ගත කිරීමේ කෙටිකාලීන ණය අංක 2926582 සඳහා රු. 43,383,999.21 ක මුළු මුදලක් (2025 ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 29,000,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 20% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(*b*) ප්‍රතිව්‍යුහගත පූර්ව නැව්ගත කිරීමේ කෙටිකාලීන ණය අංක 2944131 සඳහා රු. 33,510,817.21 ක මුළු මුදලක් (2025 ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 22,500,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 20% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; සහ

(*c*) ප්‍රතිව්‍යුහගත පූර්ව නැව්ගත කිරීමේ කෙටිකාලීන ණය අංක 2942746 සඳහා රු. 6,500,000.00 ක මුදලක දිය යුතු මුල් මුදලේ කොටසක් සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,500,000.00 ක එකී මුදල මත වර්ෂයකට 20% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 43, වැල්ලවත්ත බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැල්ලවත්ත පිහිටි හැව්ලොක් පාරේ, වරිපනම් අංක 324/7 7/2 දරන බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් 2010 ජනවාරි මස 15 වැනි දින පිළියෙල කරන ලද අංක 5770 දරන සහාධිපත්‍ය පිඹුරේ දැක්වෙන B/F06/U6 ලෙස දැක්වෙන සහාධිපත්‍ය අනු නිවස් ඒකක B/F06/U6 ට මායිම් පහත පරිදිය :-

*උතුරට* : මෙම කොටස සහ CE-B1 අතර බිත්ති මධ්‍යය, B/F6/U4 කොටස, CE-B16D මගින් ද;

*නැගෙනහිරට* : මෙම කොටස සහ CE-B16D කොටස අතර බිත්ති මධ්‍යය, B/F6/U5 කොටස, CE-B14, CE-B44 මගින් ද;

*දකුණට* : මෙම කොටස සහ CE-B44 කොටස අතර බිත්ති මධ්‍යය, CE-B14 මගින් ද;

*බස්නාහිරට* : මෙම කොටස සහ CE-B44 අතර බිත්ති මධ්‍යය, CE-B1 මගින් ද;

*මුදුන* : මෙම කොටසට ඉහළින් B/F7/U6 කොටසේ කොන්ක්‍රීට් මහලේ මධ්‍යය මගින් ද;

*පතුල* : B/F5/U6 කොටසට ඉහළින් මෙම කොටසේ කොන්ක්‍රීට් මහලේ මධ්‍යය මගින් ද,

මායිම් වූ වර්ග මීටර් එකසිය අනූ හතර (වර්ග මීටර් 194) ක විශාලත්වයෙන් වූ බිම් ප්‍රදේශයකි.

ගොඩනැගිලි සංකීර්ණය ඇතුළත විශේෂයෙන් ම භාවිතයට නම් කළ ප්‍රදේශයේ එක් ඉඩක් ඇතුළත එක් වාහනයක් නවතා තැබීමට ඇති අයිතිය සමග වේ. කිසියම් අවිනිශ්චිතභාවයක් ඇති නොවීම පිණිස, ගොඩනැගිලි ඒකකයේ භාවිතය සඳහා පමණක් වෙන් කර ඇති විශේෂිත වාහන නවතා තැබීමේ ඒකකයක් නොමැති වනු ඇත.

මෙම කොටසේ නොබෙදූ කොටස් වටිනාකම් වෙන්කිරීම හැට (60) වේ.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත්ඉරුව Con. SP 45/92 යටතේ ලියාපදිංචිකර ඇත.

සභාධිපත්‍යය දේපළේ ව්‍යවස්ථාපිත පොදු උපාංග 1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වගන්තිය මගින් සංශෝධනය කරන ලද පරිදි සහ 2003 අංක 39 දරන (සංශෝධන) පනත පරිදි 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් නීතියේ 26 වගන්තියේ දක්වා ඇති පරිදි වේ. -

(1) සභාධිපත්‍ය දේපළට අනුබද්ධ විවෘත අවකාශ ඇතුළත් ගොඩනැගිල්ල දරන ඉඩම;

(2) ගොඩනැගිල්ලේ අත්තිවාරම්, කණු, මහා බාල්කය, බාල්ක, ආධාරක, ප්‍රධාන බිත්ති සහ වහල;

(3) විදුලිය, දුරකථන, ගුවන් විදුලි විකාශන, රූපවාහිණි, ජල නළ ජල ටැංකි, ජල වළ, උඩින් පිහිටි වතුර ටැංකි, පොම්පාගාරය, නළ, කසල මාර්ගය, කවාට සහ කසල බැහැර කිරීම වැනි මධ්‍යම සේවාවන් සඳහා සවිකිරීම්;

(4) දේපළේ පැවැත්ම, නඩත්තුව, ආරක්ෂාව සඳහා අවශ්‍යවන හෝ පහසුවන සාමාන්‍යයෙන් පොදුවේ පාවිච්චි කරන, දේපළේ අනෙකුත් සියලුම කොටස් සහ පහසුකම්.

බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් 2010 ජනවාරි මස 15 වැනි දින පිළියෙල කරන ලද අංක 5770 දරන සභාධිපත්‍ය පිඹුරේ සහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. කේ. වෙගොඩපොල විසින් 2011 පෙබරවාරි මස 24 වැනි දින සහතික කරන ලද පැවරුම් අංක 382 දරන ඔප්පුවේ විස්තර කරන ලද සියලු පොදු උපාංග සමග වේ.

2025 ජූලි මස 30 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

09-270

---

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මහරගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංක : 3086208, 3086232, 3086225 සහ 3086268
එක්ස් ඔටික් ලෙෂර් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2023 මාර්තු මස 10 වැනි දින සහතික කරන ලද අංක 6729 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක්වන (ලියාපදිංචි අංක PV94482 දරන) පැලවත්ත, පන්නිපිටිය පාරේ, අංක 948/1 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති එක්ස් ඔටික් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ පිටකෝට්ටේ, ජනතා මාවතේ, සෙලින්කෝ හවුස්, අංක 33/9 දරන ස්ථානයේ දේවමුල්ලගේ තෙදිනි සෙනාරා පෙරේරා උකස්කරු හැටියට සහ ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී එක්ස් ඔටික් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එකී දේවමුල්ලගේ තෙදිනි සෙනාරා පෙරේරා පැහැර හැර ඇති හෙයින් ,

සහ එකී උකස් බැඳුම්කරය මත, ප්‍රතිව්‍යුහගත ණය අංක 3086208, 3086232, 3086225 සහ 3086268 සම්බන්ධයෙන් 2025 ජූනි මස 19 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන්, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හැත්තෑ හතරයි හය ලක්ෂ විසිපන්දහස් එකසිය පනස් අටයි ශත තිස් හයක (රු. 74,625,158.36) මුදලක් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හැත්තෑ හතරයි හය ලක්ෂ විසිපන්දහස් එකසිය පනස් අටයි ශත තිස් හයක (රු. 74,625,158.36) මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 6729 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය, කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ ඇරැව්වාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(1) ප්‍රතිව්‍යුහගත ණය 3086208 සඳහා රු. 40,874,203.45 ක මුළු මුදලක් (2025 ජූනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජූනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 32,862,663.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 18.5% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ;

(2) ප්‍රතිව්‍යුහගත ණය 3086232 සඳහා රු. 16,655,137.56 ක මුළු මුදලක් (2025 ජූනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ

පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 13,528,321.48 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 18.5% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(3) ප්‍රතිව්‍යුහගත ණය 3086225 සඳහා රු. 9,987,002.58 ක මුළු මුදලක් (2025 ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,175,928.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.0% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; සහ

(4) ප්‍රතිව්‍යුහගත ණය 3086268 සඳහා රු. 7,108,814.77 ක මුළු මුදලක් (2025 ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,918,064.35 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 18.5% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමා ඇතුළත, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කිරුළපන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, කිරුළපන ගමේ, කොට්ඨාසය 44 හි පිහිටි පූර්වාරාම පාරේ, වරිපනම් අංක 89/2 දරන "මූණමල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. සුහසිංහ විසින් 2003.09.19 වැනි දින පිළියෙල කරන ලද අංක 2066 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 8328 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පූර්වාරාම පාරේ, වරිපනම් අංක 89 දරන ලොට් $502^{B5}$ මගින් ද; නැගෙනහිරට: පූර්වාරාම පාරේ, වරිපනම් අංක 87 දරන එම ඉඩමේ ලොට් 503 මගින් ද; දකුණට : ලොට් 8329 මගින් ද සහ බස්නාහිරට : ලොට් $502^{B6}$ (පාර) මගින් ද මායිම් වූ එකී අංක 2066 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම තුනයි හතක (පර්. 12.37)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව SPE 64/121, 122 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් 1970.05.09 වැනි දින පිළියෙල කරන ලද අංක 328 දරන පිඹුරේ ලොට් $502^{B6}$ මතින් ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

2025 ජූලි මස 30 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

09-269

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මහරගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංක : 2877002 සහ 2433326
ෂාප් ග්‍රැෆික් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2017 ජූලි මස 06 වැනි දින සහතික කරන ලද අංක 3358 සහ 2019 ජූලි මස 24 වැනි දින සහතික කරන ලද අංක 3895 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2022 පෙබරවාරි මස 28 වැනි දින සහතික කරන ලද අංක 6491 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන ලියාපදිංචි අංක PV11985 දරන පන්නිපිටිය, පරණ කැස්බෑව පාරේ, අංක 47 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති ෂාප් ග්‍රැෆික් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉහත කී ෂාප් ග්‍රැෆික් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් පැහැර හැර ඇති හෙයින්,

සහ මෙහි පහත පෙන්වන පරිදි එකී උකස් බැඳුම්කරයන් මත, ඉහත කී ණය අංක 2877002 සහ 2433326 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන්, වෙනත් කරුණු අතර, රුපියල් මිලියන එකසිය එකොළහයි පන් ලක්ෂ අසූ පන් දහස් හාරසිය තුනයි ශත තිස් හතරක (රු. 111,585,403.34)ක මුදලක් 2025 ජුනි මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකසිය එකොළහයි පන් ලක්ෂ අසූ පන් දහස් හාරසිය තුනයි ශත තිස් හතරක (රු. 111,585,403.34) මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 3358, 3895 සහ 6491 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ්

සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය, කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ ඇරැව්වාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි:

(*a*) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2877002 සඳහා රු. 103,912,480.68ක මුළු මුදලක් (2025 ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 ජුනි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 94,206,519.11ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 14.00% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; සහ

(*b*) ප්‍රතිව්‍යුහගත පොළිය නිදහස් කාලීන ණය අංක 2433326 සඳහා රු. 7,672,922.66ක මුදලක් 2025 ජුනි මස 19 වැනි දින දක්වා වේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුළත, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 530 - මහරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පන්නිපිටිය පිහිටි "කහටගහවත්ත *හෙවත්* කහටගහලන්ද සහ ගීමඩුල්ලේ කනත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 2010.01.03 වැනි දින පිළියෙල කරන ලද අංක 5692 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්: උතුරට : ශ්‍රී ලංකා රජයේ දුම්රියට අයත් පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : ඩී. ඒ. සෙලෙස්තිනා පෙරේරා විසින් හිමිකම්ලත් ඉඩම සහ පරණ කැස්බෑව පාරේ, වරිපනම් අංක 53 (අංක 1632 දරන පිඹුරේ ලොට් A හි ඉතුරු කොටස) මගින් ද; දකුණට : පරණ කැස්බෑව පාරේ, වරිපනම් අංක 53 (අංක 1632 දරන පිඹුරේ ලොට් A හි ඉතුරු කොටස) සහ පරණ පාර මගින් ද සහ බස්නාහිරට : අඩි 10 පළල පාර (අංක 442 දරන පිඹුරේ ලොට් 8) සහ අංක 3014A දරන පිඹුරේ ලොට් 5B මගින් ද මායිම් වූ එකී අංක 5692 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් හතක (රූ.1,පර්.7) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B 402/63 යටතේ ලියාපදිංචි කර ඇත.

2025 ජූලි මස 30 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

09-271

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

1. ඩී. ඩී. කස්තුරිආරච්චි ඇන්ඩ් සන්ස් -
ගිණුම් අංකය : 0084 1000 0289

2. ඩී. කේ. මාර්ටින් ග්ලාස් මි(ර)ර් (ප්‍රයිවට්) ලිමිටඩ් -
ගිණුම් අංකය : 0084 1000 1889

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. ආර්. රන්ගම විසින් ලියා සහතික කරන ලද 2017 සැප්තැම්බර් මස 19 දාතම හා අංක 2010 දරන, 2019 ජුනි මස 17 දාතම හා අංක 2916 දරන, 2020 මාර්තු මස 11 දාතම හා අංක 3195 දරන සහ 2019 මාර්තු මස 28 දාතම හා අංක 2816 දරන උකස් බැඳුම්කර සියල්ල සහ බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව විසින් ලියා සහතික කරන ලද 2022 ජූලි මස 27 දාතම හා අංක 3900 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "ඩී. ඩී. කස්තුරිආරච්චි ඇන්ඩ් සන්ස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරුවන ජගත් කස්තුරිආරච්චි බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. ආර්. රන්ගම විසින් ලියා සහතික කරන ලද 2017 සැප්තැම්බර් මස 19 දාතම හා අංක 2012 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක PV 117501 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන ඩී. කේ. මාටින් ග්ලාස් ඇන්ඩ් මිර(ර්) (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා ජගත් කස්තුරිආරච්චි උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

